Lanka e News

# වාර්ෂික යුද වියදමට සමාන මුදලක් මේ ඇමැති මණ්ඩලය හොරකම් කරනවා: දේශප්‍රේමීන් කෝ? -නීතීඥ ශිරාල්




(ලංකා ඊ නිව්ස්- 2008,දෙසැ.03. ප.ව.2.30) රාජපක්ෂ ආණ්ඩුවේ සියලු දූෂණවලට එරෙහිවත්, විශේෂයෙන්ම 'හෙජින්' ගනුදෙනුවට අදාල ඉදිරි නීතිමය කටයුතු සඳහා ජාත්‍යන්තර අධිකරණයට යන බවත්, දූෂිතයන් පිටරටවල එකතු කර ඇති මුදල් යළි රටට ලබා ගැනීමට විදේශයන්හි පවා නඩු දමන බවත්, 'දූෂණ විමසුම' මඟින් සංවිධානය කළ 'හෙජින් සූදුවෙන් හෙළිවන සමාජ දේශපාලන යථාර්ථය' මැයෙන් ඊයේ (02) පැවැති සම්මන්ත්‍රණයේදී නීතිඥ ශිරාල් ලක්තිලක මහතා පැවැසිය.

මෙක්සිකෝවේ මැරීඩා නගරයේදී 2003 දෙසැම්බර් 09 දින අත්සන් කරන ලද 'එක්සත් ජාතීන්ගේ අන්තර් ජාතික දූෂණ විරෝධී සම්මුතියට' අනුව ඉදිරි නීතිමය කටයුතු සිදුකොට මෙරට ජනතාවට සාධාරණය ඉටුකරන බව ඔහු වැඩිදුරටත් ප්‍රකාශ කළේය.

යුද්ධයෙන් සූදු කෙලින ආණ්ඩුව 'හෙජින්' වැනි ගිවිසුම් අටවා මහජන මුදලින් තවතවත් සූදු කෙලින අතර වර්තමාන ආණ්ඩුවේ මුලු දේශපාලන අධිකාරියම මෙම සූදුවට සම්බන්ධ බව ප්‍රකාශ කළ නීතිඥ ලක්තිලක රටේ ජාතික ආදායම වන රුපියල් බිලියන 750 න් රුපියල් බිලියන 600 ක්ම ණය හා වාරික ලෙස ගෙවීමට සිදුවී ඇති යුගයක ඉතිරි රුපියල් බිලියන 150 ත් ආණ්ඩුවේ මැති ඇමැතිවරුන් හොරකම් කිරීම මෙරට ජනතාවට කරන විශාල අපරාධයක් නොවේදැයි ප්‍රශ්න කළේය.

හෙජින් ගිවිසුමට අමතරව තවත් දූෂණයක් තෙල් සංස්ථාව තුළ සිදුවෙමින් පවතින බව තමාට තොරතුරු ලැබී ඇති බව පැවැසූ ලක්තිලක මහතා මේ වනවිට බොරතෙල් මෙට්‍රික් ටොන් එකක්

ඉරානයේ සිට මෙරටට ගෙන්වීමට ඩොලර් 12 ක් නැව් ගාස්තු ලෙස ගෙවන්නේ ඩොලර් 07 ට තෙල් ප්‍රවාහනය සඳහා නැව් සමාගම් ඉදිරිපත් වී සිටියදී බව ප්‍රකාශ කළේය. මෙම ක්‍රියා පටිපාටිය නිසා තෙල් සංස්ථාවට මිලියන 600 ක පාඩුවක් සිදුවුවද, කැබිනට් අනුමැතිය ලබාගැනීමට පවා අසන්ත ද මෙල් මහතා සමත් වී ඇත.
වාර්ෂිකව යුද්ධයට වියදම් කරන ප්‍රමාණයට සමාන මුදලක් ඇමැති මණ්ඩලය විසින් හොරකම් කරන බවත්, හෙජින් ගිවිසුම නිසා දෙසැම්බර් 15 වන විට රුපියල් මිලියන 4000 ක් මේ රටට අහිමිවන බවත්, මෙය රාජපක්ෂ ආණ්ඩුවේ ප්‍රථම හා එකම දූෂණය නොවන අතර මෙවැනි දූෂණ ඉදිරියේදීත් සිදුකිරීමට පිඹුරුපත් සකසමින් සිටින බව ප්‍රකාශ කළ ලක්තිලක මහතා, මේ ආණ්ඩුව යුද්ධය කරන බව පෙන්වා භාණ්ඩාගාරය කොල්ලකන බව ප්‍රකාශ කළේය. දේශප්‍රේමය ලෙස නංගි පෙන්වා, අක්කා දීග දෙන්නට සැරසෙන බව ද ප්‍රකාශ කළේය.

*ආණ්ඩුව අද හෙලුවෙන් ඇවිදිනවා*
රෙදි ඇඳගෙන ගිය රාජපක්ෂ ආණ්ඩුව අද හෙලුවෙන් ඇවිදින බව, මෙම සම්මන්ත්‍රණයට සහභාගී වූ එක්සත් සමාජවාදී පක්ෂයේ නායක සිරිතුංග ජයසූරිය මහතා ප්‍රකාශ කළේය. දූෂණය මේ ආණ්ඩුවේ ගර්භාෂයේ සිටම පැවැති බවත්, එය ආරම්භ වුනේ හෙල්පින් හම්බන්තොටෙන් බවත්, මේ ආණ්ඩුවේ දූෂණ හා වංචා දේශප්‍රේමීන්ට නොපෙනීම පුදුම සහගත බවත්, 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක නොකර මොන පක්ෂය බලයට ආවත් දූෂණය තුරන් කළ නොහැකි බවත් ඔහු වැඩිදුරටත් ප්‍රකාශ කළේය.

මෙරට වෙළෙඳ පොළේ ඩීසල් මිල රුපියල් 110 ව තිබියදී ජාත්‍යන්තර නැව් සමාගම්වලට රු. 85 ට ඩීසල් විකුණන තෙල් සංස්ථාව, මෙරට අහිංසක ජනතාවගේ හිසමත බර පටවා තිබීමෙන් මේ ආණ්ඩුවේ දේශප්‍රේමයේ තරම වටහා ගත හැකි බව මෙම සම්මන්ත්‍රණයට සහභාගී වූ එජාප පාර්ලිමේන්තු මන්ත්‍රී දයාසිරි ජයසේකර මහතා ප්‍රකාශ කළේය.

ඉදිරියේදී බිහිවන එජාප ආණ්ඩුවකදී වුවත් මෙවන් දූෂණ සිදුවුවහොත් ඊට එරෙහිව උසාවි යාමට තමන් සූදානම් බව රවි කරුණානායක සහ දයාසිරි ජයසේකර මන්ත්‍රීවරු ප්‍රකාශ කළේය.

කීනියාවල පාලිත හිමියන් සහ නීතිඥ රවි ජයවර්ධන මහතාද සම්මන්ත්‍රණයට සහභාගී වූහ.
*ඡායාරූප හා වාර්තාව: සිසිර සී විතානගේ*